**අම්බලන්තොට ප්‍රාදේශීය සභාව,**
**හම්බන්තොට දිස්ත්‍රික්කය.**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 10 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී නිම කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති 03 කට අදාළ වියදම් රු.3,622,653 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු වාහන 05 ක එකතු වටිනාකම වූ රු. 2,237,750 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වත්කම් නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් සභාව වෙත පවරා දුන් ලොරි ජල බවුසරයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාළ එකතුව රු. 13,146,650 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 2,299,264 ක් වූ අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ වරිපනම් හා ආයෝජන ගිණුම්වල පැවති අසමානතාව 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 78,810,763 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2016 වර්ෂයේ ආරම්භක ශේෂයට ආළව උපලේඛන සකස් කර නොමැති බවත්, තැන්පතු පිළිබඳව සොයා බැලීමට කටයුතු කරන බවත්, මැනුම් වාර්තා සහ අවසාන බිල්පත් සකස්කර නොමැති බව සහ 2020 වර්ෂයේ අවසාන ගිණුම සඳහා උපලේඛන ලබා දීමටත් කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(2) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කල යුතු ප්‍රදේශ කාලීනව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පනතේ 134(2) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ නිශ්චිතව හඳනා ගැනීම සඳහා සහා අනුමැතිය ලැබී නොමැති බව දන්වා සිටිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය<br>-------------------- | | | |
| i. | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම අඩුපාඩුව නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| ii. | රීති 33 | වරිපනම් බදු ගෙවීම් නොකල පුද්ගලයින් පිළිබඳව ලයිස්තුවක් වාර්ෂිකව සකස්කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු හිඟ පවතින දේපළ හිමියන් හට දේපළ තහනම් කිරීමේ රතු නිවේදන නිකුත් කර දින 14 ක් තුළදී හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------- | | | |
| i. | මු.රෙ. 571 | වසර දෙක ඉක්මවූ රු. 621,673 ක් වූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම තැන්පත් වලින් රු. 338,571 ක් මේ වන විට නිරවුල් කළ බවත්, ඉතිරි තැන්පත් ශේෂ ඉදිරියේදී නිරවුල් කරමි. |
| ii. | මු.රෙ. 702 (3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම් වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ගිවිසුම් වල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| iii. | මු.රෙ. 1645 (ආ),(ඇ) සහ 1646 | සභාවේ වාහන 24 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දෛනික ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කළද, ඉතිරි වාහන 24 සඳහා වන ධාවන සටහන් කඩිනමින් ඉදිරිපත් කරමි. |
| (ඉ) | වෙනත් චක්‍රලේඛ හා ලිපි<br>-------------------- | | | |
| i. | පළාත් පාලන කොමසාරිස් 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො / 2010 / 01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය සහ 06 ඡේදය | සභාව සතු කඩ කාමර 26 ක ගිවිසුම් සහ කඩ කාමර 12 ක තක්සේරු වටිනාකම යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 12 ක් සඳහා ගිවිසුම් අත්සන් කිරීමට ආරාධනා කළද, 2019 වර්ෂය තුළ ගිවිසුම්ගත වීමට නොපැමිණි බවත්, ඉදිරියේදී එම ගිවිසුම් ගත වීමට කටයුතු කරමි. |
| ii. | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/REG/ 2015/08 පොදු (i) දරණ ලිපියේ 4.3 (ආ), (ඉ) ඡේද | සේවකයන් තිදෙනකුගෙන් අයවිය යුතු වටිනාකම රු. 178,914 ක් වූ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ණය අය කර ගැනීම සම්බන්ධව දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති අංශයෙන් උපදෙස් ලබා ගැනීමට ලිපි ඉදිරිපත් කරමි. |
| iii. | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 ජනවාරි 30 දිනැති අංක PFD / RED / COPA / 2019 / 01 දරණ ලිපියේ 04 ඡේදය | වාර්ෂිකව කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා වාර්ෂිකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,866,768 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,329,171 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු. 1,537,597 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් හා බදු | 5,184,100 | 5,239,504 | 3,221,316 | 3,883,984 | 4,910,100 | 4,632,546 | 3,409,957 | 4,008,274 |
| කුලී | 16,870,100 | 16,065,589 | 14,655,682 | 3,541,738 | 16,723,700 | 15,764,400 | 15,207,683 | 3,455,208 |
| බලපත්‍ර ගාස්තු | 2,604,000 | 2,771,871 | 2,391,481 | 381,390 | 2,531,300 | 2,608,934 | 2,476,934 | 233,280 |
| වෙනත් ආදායම් | 28,635,900 | 26,365,074 | 8,544,725 | 36,309,106 | 86,315,300 | 82,248,941 | 67,152,044 | 26,806,049 |
| එකතුව | 53,294,100 | 50,442,038 | 28,813,204 | 44,116,218 | 110,480,400 | 105,254,821 | 88,246,618 | 34,502,811 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ඒකක 6,223 කින් වරිපනම් බදු රු. 3,470,998 ක් අයවීමට තිබූ අතර පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව එම හිඟයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද හිඟ ශේෂය තුළ වටිනාකම රු. 5,000 ට වැඩි බදු ඒකක 46 කින් රු. 1,110,437 ක් අය වීමට තිබූ අතර හිඟ හිටි කාල පරාසය කාර්තු 03 ත් 105 ත් අතර විය. | හිග ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | බදු ඒකක 07 ක් රජයේ දේපල බවත්, එම ආයතන සඳහා හිඟ බදු ගෙවන ලෙස කිහිප අවස්ථාවකදීම ලිපි මඟින් දන්වා යැවූ බවත්, අනෙකුත් හිඟ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් 2011 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයටද බදු අයකර තිබුණි. | වරිපනම් තක්සේරුව වසර 05 කට වරක් කළ යුතුවේ. | වරිපනම් බදු ප්‍රතිශෝධනය කර දෙන ලෙස අවස්ථා 08 කදී ලිපි යොමු කළ බවත්, හම්බන්තොට දිස්ත්‍රික් තක්සේරු කාර්යාලය හැකි ඉක්මනින් එම කටයුතු ආරම්භ කරන බවට දන්වා ඇත්තෙමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ව්‍යාපාර ඒකක 106 කින් අයවිය යුතු ව්‍යාපාර බදු රු. 225,000 ක් අයකර | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟයෙන් ව්‍යාපාර 79 ක් වෙනුවෙන් රු. 147,650 ක් අයකර ගත් බවත්, ව්‍යාපාර 12 ක් සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන |

| | | |
|---|---|---|
| ගැනීමට කටයුතු කර නොතිබුණි. | | ඇති බවත්, ඉතිරි ව්‍යාපාර 11 සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු කඩ කාමර සහ කඩ අල්ලි 250 කින් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු රු. 54,265 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද හිඟ හිටි කාල පරාසය මාස 06 ත් 33ත් අතර විය. | හිග කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදලින් රු. 6,470 ක් අයකළ බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු පොදු වෙළඳ පොළ, සතිපොළ හා අනෙකුත් ටෙන්ඩර් කරන ලද දේපල 10 කින් ලැබිය යුතු එකතුව රු. 399,860 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟයෙන් රු. 233,105 ක් අයකර ගත් බවත්, රු. 23,585 ක් ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් කපා හැරීමට අනුමැතියට යවා ඇති බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 යන්ත්‍රෝපකරණ කුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව සතු බැකෝලෝඩරය හා ගලිබවුසරය සේවා සැපයීම වෙනුවෙන් ලැබිය යුතු රු. 167,200 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 110,500 ක් අයකළ බවත්, ඉතිරිය අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 5,599,268 ක් හා රු. 11,983,947 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට රු. 3,500,000 ක් අයකර ගෙන ඇති බවත්, ඉතිරිය අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කරුණු 07 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි. |

#### (ආ) තිරසර සංවර්ධන අභිමථාර්ත ඉටු කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | 2019 වර්ෂය තුළ සංවර්ධන අරමුණු සහ ඉලක්ක ලඟා කර ගැනීම සඳහා කාර්යයන් 06 ක් සිදුකර ඇති බවත්, තිරසර සංවර්ධනය සඳහා වන දිගු කාලීන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ඉතිරිකිරීමේ ගිණුම් 03 ක එකතුව රු. 1,772,281 ක් වූ අතර එම මුදල් ඵලදායී ආයෝජන මාර්ගවල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ඉතුරුම් ගිණුම් වල පවතින මුදල් සුදුසු පරිදි ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉතිරි කිරීමේ ගිණුම්වල පවතින මුදල් ඵලදායී ආයෝජන මාර්ගවල යෙදවීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 13 ක් පිරවීමට සහ අතිරික්තතා 03 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු 13 න් 06 ක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව ජ්‍යෝෂ්ඨ හා ද්විතීය ශ්‍රේණියේ තනතුරු බවත්, එම තනතුරු සම්බන්ධ පත්වීම් බලතල සභාව සතුව නොමැති බවත්, අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ආදේශක පරිගණක දත්ත ක්‍රියාකරුවන් දෙදෙනෙකු III ශ්‍රේණියේ තනතුරට පත් කර වසර 05 ක් ගතවී තිබුණද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් එම තනතුරු අනුමත කරවාගෙන නොතිබුණි. | පත්කිරීම් කිරීමට අදාල අනුමැතීන් ලබාගත යුතුවේ. | මේ සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/2/7/1/ Carder IX හා 2019 ජූලි 19 දිනැති ලිපිය මගින් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා යොමු කර ඇත. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් සහ මානව සම්පත් සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ බවත්, 2020 වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර සභාවේ සම්මත කර ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වාහන නඩත්තුව හා අළුත්වැඩියාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 04 ක් ධාවනයෙන් ඉවත් කර තිබූ නමුත්, එම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ධාවනයෙන් ඉවත් කළ වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් මෙම වාහන වෙන්දේසි කිරීමට යෝජනා කර ඇති බවත්, පළාත් යාන්ත්‍රික ඉංජිනේරු දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරමි. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් සභා කටයුතු සඳහා යොදවා ගනු ලබන වාහන 07 ක, ඉඩම් 12 ක සහ ගොඩනැගිලි 73 ක නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පවරා ගෙන නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැඟිලි සභාවට පවරා දෙන ලෙස අවස්ථා ගණනාවකදී අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් කර තිබුණද, මේ වන තෙක් ඉටු නොවූ බවත්, වාහන 07 ක අයිතිය ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමි. |

### 3.4.3 නිශ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු එකතුව රු. 145,930 ක් වූ නල ළිං ගබඩා උපකරණ හා ජල ව්‍යාපෘති ආධාර උපකරණ දිගු කලක් තිස්සේ භාවිතයෙන් තොරව නිශ්ක්‍රීයව පැවතුණි. | සභාව සතු උපකරණ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරි වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ තීරණ මත කටයුතු කරමි. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව සභාව සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව පිළියෙල කිරීමට කටයුතු කරමි. |

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා අරමුදලින් ඉටු කිරීමට යෝජිතව තිබූ කර්මාන්ත 03 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිම වී නොතිබුණු අතර, රු. 1,200,000 කට අනුමත කර තිබුණු අම්බලන්තොට වලවේ ගඟ සංචාරක බෝට්ටු ප්‍රවාහන මධ්‍යස්ථානයේ ඉදිකිරීම කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | වර්ෂයට අදාල සංවර්ධන කටයුතු වර්ෂය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත ප්‍රමාද වීමට හේතු වූයේ අධික වර්ෂාව හා වෙළඳ පොළේ තාර මිලදී ගැනීමට නොමැති වීම බවත්, වලවේ ගඟ සංචාරක බෝට්ටු ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු වලට අදාල මිල විශ්ලේෂණ සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් අනුමැතිය ලැබීම ප්‍රමාද වීමත්, ඕපෝවත්ත ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රාදේශීය ලේකම් ගේ අනුමැතිය ප්‍රමාදවීමේ හේතුවත් මෙම කර්මාන්තය සඳහා ගිවිසුම් ගතවීමට නොහැකි වීමට හේතු වූ බව දන්වමි. |

### 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් සකස් කර තිබුණු අභ්‍යන්තර විගණන සැලැස්ම සභාපති අනුමත කර නොතිබූ අතර, අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූලව විගණනයක් සිදු නොකර තොග ගබඩා පරීක්ෂාව පමණක් සිදුකර තිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයට අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර නොතිබීම පිළිගන්නා බවත්, 2020 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම 2019 දෙසැම්බර් 10 මහා සභාවට යොමු කර අනුමත කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවේ අභ්‍යන්තර විගණකට විගණනයට අදාල නොවන වෙනත් විෂයයන් පැවරීම සිදු කර තිබුණි. | අභ්‍යන්ත විගණන රාජකාරි පමණක් පැවරිය යුතුවේ. | 2019 වර්ෂයේදී නිලධාරීන් 04 ක පුරප්පාඩු සහ ප්‍රසූත නිවාඩු ලබා සිටි නිලධාරීන් දෙදෙනෙකු සිටි බැවින් වෙනත් විෂයයන් පැවරීම සිදු කලෙමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කරමි. |